# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 12,782 — 1961 නොවැම්බර් 24 වැනි සිකුරාදා — 24.11.1961**

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡේදය – සාමාන්‍ය

## ආණ්ඩුවේ නිවේදන

ඇල්. ඩී.—බී. 138/47.

අංකය : 37/17/පීසී
පී. සී. සී. අංක ඒ/744/10

### රේගු නිවේදනය (ගාස්තු චක්‍රය) අංකය 61/7—රේගු ආඥාපනත

1947 සැප්තැම්බර් මස 24 වැනි දින හා අංක 9,773 දරණ අති වි . ශෂ ගැසට් පත්‍රයෙහි පළ කරන ලද ප්‍රකාශනයෙන් වෙනස් කරන ලද රේගු ආඥාපනතේ (185 වැනි අධිකාරය) 9 වැනි වගන්තිය යටතේ වූ පහත සඳහන් යෝජනාව 1961 ඔක්තෝබර් මස 27 වැනි දින පවත්වන ලද නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ ප්‍රසිද්ධ සභා වාරයේදී සම්මත කරනු ලැබූ බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

හ. ෂ. අමරසිංහ,
මුදල් අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1961 නොවැම්බර් 22,
කොළඹදීය.

#### යෝජනාව

මේ යෝජනාව ආණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි පළ කරන දිනයෙහි සිට, ආනයන කරන ලද රටඉඳි පිළිබඳව රේගු ආඥාපනත (185 වැනි අධිකාරය) යටතේ තීරු බද්ද අවලංගු කරන ලද බව 1947 සැප්තැම්බර් මස 24 වැනි දින හා අංක 9,773 දරණ අති විශෙෂ ගැසට් පත්‍රයෙහි පළ කරන ලද ප්‍රකාශනයෙන් වෙනස් කරන ලද රේගු ආඥා පනතේ (185 වැනි අධිකාරය) 9 වැනි වගන්තිය යටතේ මේ සභාව තීරණය කරයි.

11–105

---

ඇල්. ඩී.—බී. 45/45.

### 1943 අංක 19 දරන කෘෂිකාර්මික සහ කාර්මික ණය දෙන ආයතන ආඥා පනත

මෙහි පහත දක්වෙන ව්‍යවස්ථාව 1943 අංක 19 දරන කෘෂිකාර්මික සහ කාර්මික ණය දෙන ආයතන ආඥා පනතෙහි 85 වෙනි වගන්තියේ (1) වෙනි උප වගන්තිය යටතේ ලංකාවෙ කෘෂිකාර්මික සහ කාර්මික ණය දෙන ආයතනයෙහි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්පාදනය කර ඇති බවත්, අංක 9,828 හා 1948 පෙබරවාරි මස 5 වෙනි දින දරන අති විශේෂ ගැසට් පත්‍රයෙහි පළ වූ ප්‍රකාශනයෙන් වෙනස් කරනු ලැබූ පරිදි ඒ වගන්තියෙහි (2) වෙනි උප වගන්තියෙන් තමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර මුදල් ඇමතිවරයා විසින් ස්ථිර කර තිබෙන බවත්, මෙයින් නිවේදනය කරනු ලැබේ.

හ. ෂ. අමරසිංහ,
මුදල් අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1961 නොවැම්බර් 22 දින,
කොළඹ.

#### ව්‍යවස්ථාව

කෘෂිකාර්මික සහ කාර්මික ණය දෙන ආයතන ආඥා පනතෙහි 85 (1) (කේ) වගන්තිය යටතේ සම්පාදනය කරනු ලැබ, 1948 නොවැම්බර් මස 19 වෙනි දින හා අංක 9,920 දරන ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබූ ව්‍යවස්ථා, කලින් කල සංශෝධනය කරනු ලැබ, එහි අංක 2 බී දරන ව්‍යවස්ථාව වෙනුවට පහත සඳහන් අළුත් ව්‍යවස්ථාව ආදේශ කිරීමෙන් මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ:—

" 2 බී. 1961 දෙසැම්බර් මස පළමුවෙනි දින සහ ඉන්පසු අනුමත කරනු ලබන සෑම ණය මුදලකට ම පොලී ප්‍රමාණය, මණ්ඩලය විසින් ස්වකීය අභිමතය පරිදි තීරණය කළ හැකි, වර්ෂයකට ප්‍රතිශත පහකුත් දෙකෙන් එක් කොටසකට නො අඩුවූද, වර්ෂයකට ප්‍රතිශත හයකුත් දෙකෙන් එක් කොටසකට නො වැඩි වූද, ප්‍රමාණයක් විය යුතු ය. "

11—62

---


ලංකාවේ වාලච්චේනයෙහි පිහිටි " ඊස්ටන් පේපර් මිල්ස් කෝපරේෂන් " හි නිපදවන ලද කඩදාසිවල
ලංකාණ්ඩුවේ මුද්‍රණාලයයේ මුද්‍රාපිතයි.

2133—ජේ. ඇන්. ආර් 155—5,461 (11/61)